
1

# ලොව තොරතුරු ගෙදර දී ම

නිවසේ විදුලි සීනුව නාද විය.

ට්‍රීං........ ට්‍රීං........ ට්‍රීං........

තරංගගේ මව ඉක්මනින් අවුත් දොර ඇරියා ය.



"සුබ උදෑසනක් කමලා නැන්දේ......" මහේන්ද්‍රන් සහ නිසාම් එක වරට ම කීහ.

"සුබ උදෑසනක් පුතාලට."

"එන්න, මහේන්ද්‍රන් පුතා, වාඩිවෙන්න... නිසාම් පුතා, එන්න

වාඩිවෙන්න.... අපේ තරංග පුතා දුරකථනයෙන් කතා කරකර ඉන්නවා,'' යැයි කමලා මහත්මිය කීවා ය.



තරංග, නිසාම් සහ මහේන්ද්‍රන් යන තුන් දෙනා ම ඉගෙන ගන්නේ පස් වන ශ්‍රේණියේ ය. ''අරලිය උයන'' මහල් නිවාස සංකීර්ණයේ තුන් වන මහලෙහි මහේන්ද්‍රන් සහ නිසාම් දෙදෙනා වෙසෙති. තරංගගේ නිවස ඇත්තේ බිම් මහලෙහි ය. තරංගගේ බාල සොහොයුරිය වන සුනේත්‍රා හතර වන ශ්‍රේණියෙහි ඉගෙනුම ලබන්නී ය .

මාස කීපයක සිට මෙම යහළුවෝ සෑම සෙනසුරාදවක ම තරංගගේ ගෙදරට රැස් වෙති. සතියේ දිනවල ක්‍රීඩා කටයුතුවල යෙදෙන බැවින් විවේකයක් ලැබෙන්නේ සෙනසුරාදට ය. එදින ඔවුහු සතිය තුළ ලැබූ අත්දකීම් හුවමාරු කර ගනිති.

මල් ගවුමක් ඇඳ සිටි සුනේත්‍රා සාලයට දුවගෙන ආවා ය.

''ආ! අයියලා ඇවිත් නේ! මම දන්නවා අයියලා අපේ ගෙදර එන්න කැමති ඇයි කියලා.''

''ඇයි? මොකක් ද කාරණය?'' කියමින් සාලයට පැමිණි තරංග ද කතාබහට එකතු විය.

''අපේ අම්මා සෙනසුරාදට විශේෂ කෑමක් හදනවානේ අයියලත් ඒවි කියලා!''

නිසාම් සහ මහේන්ද්‍රන් කිසිවක් නොකියා සිනාසුණහ.

''අද මම ඔන්න ආප්ප හැදුවා. උම්බලකඩ දලා ලුණුමිරිසකුත් හැදුවා,'' කමලා මහත්මිය ආප්ප පිඟාන මේසය මත තබමින් කීවා ය.




''ආප්ප මම ප්‍රිය කරන කෑමක්. හ්ම්....... හරි සුවඳයි,'' සුවඳ විඳිමින් නිසාම් කීවේ ය.

''තරංග පුතා, තාත්තාට කතා කරන්න තේ බොන්න.''

තරංගගේ පියා - ධනපාල මහතා දූරකථනයෙන් කතා කරමින් සාලයට පැමිණියේ ය. ඔහු පුටුවක් ඇද වාඩි වී දූරකථනය මේසය උඩ තැබුවේ ය.

"මාමේ, එහා මෙහා ගෙන යා හැකි දූරකථනයක් නෙ, මේ!" මහේන්ද්‍රන් කීවේ ය.

"ඔව්. මේක ජංගම දූරකථනයක්. පාවිච්චි කිරීමට පහසුයි. මම කන්තෝරු යන විටත් අරගෙන යනවා," ධනපාල මහතා පැවසුවේ ය.



තේ පානය අතරතුර ධනපාල මහතා ජංගම දූරකථන ගැන විස්තර කර දුන්නේ ය.

තේ බී නිම වීමෙන් පසු යහළුවෝ සාලයට අවුත් වාඩි වූහ. ගුවන්විදුලියෙන් ළමා ගායිකාවකගේ ගී රාවය ඇසුණේ ය.




තරංග කතාබහට මුල පිරුවේ ය.

"මම ඊයේ අපේ පාසලේ පුස්තකාලයෙන් අලුත් පොතක් ගෙනාවා. රූපවාහිනිය ගැන මේ පොතේ විස්තර තිබෙනවා," තරංග යහළුවන්ට පොත පෙන්වමින් ම කීවේ ය.

"රූපවාහිනිය නිපදවූයේ කවුද?" නිසාම් ප්‍රශ්න කළේ ය.

සුනේත්‍රා බරාඳයේ සිට කෑගැසුවා ය. "මම දන්නවා..... ජෝන් ලොගී බෙයාර්ඩ්."



ජෝන් ලොගී බෙයාර්ඩ්

"අපෝයි! පණ්ඩිතයා!...... ඔයා කොහොම ද දන්නෙ?" තරංග හරස් කපමින් විස්මය පළ කළේ ය.

"පසුගිය සතියේ ළමා පුවත්පතක ඒ නම තිබුණා. ලොගී බෙයාර්ඩ්ගේ පින්තූරයකුත් තිබුණා."

"තව තොරතුරු ටිකක් කියන්නකො, ලොගී බෙයාර්ඩ් ගැන," මහේන්ද්‍රන් තරංගගෙන් ඉල්ලා සිටියේ ය.

"රූපවාහිනිය නිපදවූ ලොගී බෙයාර්ඩ් ස්කොට් ජාතික ඉංජිනේරුවරයෙක්. ඉපදුණේ මහා බ්‍රිතාන්‍යයේ හෙලන්ස්බර්ග් නමැති නගරයේ. 1888 අගෝස්තු 13 වන ද. බෙයාර්ඩ්ගේ සොයාගැනීම ගැන මුලින් ම දැනගන්නට ලැබුණේ 1923 දී යි. රූපවාහිනිය මහජනයා අතරට ආවේ 1936 අගෝස්තු මාසයේ සිට බව මේ පොතේ සඳහන් වෙනවා."

"ලොගී බෙයාර්ඩ් මහතා රූපවාහිනිය නිර්මාණය කිරීම පිළිබඳ අපි ස්තුතිවන්ත වෙන්න ඕනැ. රූපවාහිනියෙන් නොයෙක් රටවල සිදුවන දේ දැන ගත හැකියි, නැරඹිය හැකියි. පරිසරය ආදි විෂයයන්ට අදාළ කරුණු දැනගත හැකියි," නිසාම් පැවසී ය.

"ඔව්. අපට කිසි දිනක දැකීමට නොලැබෙන දේවල් අපේ ඇස්වලින් ම නරඹන්න පුළුවන්," මහේන්ද්‍රන් ද තව කරුණු එකතු කළේ ය.

යාබද නිවසින් හුරුපුරුදු තේමා වාදනයක් ඇසිණි.

### "අන්දරේගේ කතන්දර"

තරංග රූපවාහිනිය ක්‍රියාත්මක කළේ ය.

*(සියල්ලෝ ම රූපවාහිනිය දෙසට නෙත් යොමු කළහ. රඟපාන නළුවන්ගේ නාමාවලිය තිරයේ පෙනිණි.)*



**අන්දරේ :** *(රජතුමාට නමස්කාර කරමින්)* පස්වාන් දහසකට බුදු වන්ඩ දේවයන් වහන්ස, ඔබ වහන්සේ මා කැඳවූයේ ඇයි දැයි දැන ගනු කැමැත්තෙමි.

**රජතුමා :** මෙවර සී සෑමේ මංගල්‍යය ලබන බුද දින පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබේ. සී සෑම සඳහා ගොනුන්ට කීමේ කාර්යය මම තොපට භාර කරමි.

**අන්දරේ :** යහපති, දේවයන් වහන්ස, එම භාරදූර කාර්යය මම අකුරට ම ඉටු කිරීමට මහන්සි ගන්නෙමි.

**කථක :** සී සෑමේ මංගල්‍යය විශාල උත්සවයකි. එදිනට පැමිණෙන සියලු දෙනා සඳහා ආහාර පාන, කැවිලි පෙවිලි සූදානම් කරනු ලැබේ.

බදාදා උදේ පැය කීපයක් ගත වුවත් ගොන්නු හෝ ගොනුන්ගේ අයිතිකාරයෝ හෝ දක්නට නොවූහ. අන්දරේ වහා ම රජවාසලට කැඳවන ලදි.

**රජතුමා :** අන්දරේ, සී සෑමේ මංගල්‍යය සඳහා ගොනුන්ට කීමේ කාර්යය මම තොපට භාර කළෙමි. තොප එය ඉටු කර නැති බව පෙනේ. දැන් ඉර මුදුන් වී ඇත. එහෙත් තව ම කිසිවකු පැමිණ නැත.

**අන්දරේ :** සමා වුව මැනවි, දේවයන් වහන්ස! මම ගොන්බාන්

සියයකට පමණ කීවෙමි. ගොනුන්ගෙන් ඇතැම් අය සිය හිස් පහත් කරමින් කන් සෙලවූහ. සමහරු නගුට ද ඔසොවා මහත් සතුටින් තමන්ගේ මනාපය ප්‍රකාශ කළහ. ඒ නිසා ගොනුන් සියලු දෙනා පැමිණෙන්නට ඇතැයි මම සිතුවෙමි.

**රජතුමා :** ගොනුන්ගේ අයිතිකාරයන්ට නොකීවෙහි ද?

**අන්දරේ :** නැත, දේවයන් වහන්ස. ඔබ වහන්සේ කීවේ ගොනුන්ට කියන්නට ය. ඒ නිසා මම ගොනුන්ට කීවෙමි.

**රජතුමා :** *(සිනා වෙමින්)* හඃ හඃ හා! ....... අන්දරේ, තොප කර ඇත්තේ අපූරු වැඩකි.......

*(තේමා වාදනය)*

**කථක :** අන්දරේ පිළිබඳ ඊළඟ වැඩසටහන ලබන සතියේ සෙනසුරාද බලාපොරොත්තු වන්න.

**ධනපාල මහතා :** යමක් කියන කොට පැහැදිලි ව නිරවුල් ව කිව යුතු බව හැඟවෙනවා, ඒ කතාවෙන්.

**කථක :** මෙන්න, අද විශේෂ වැඩසටහන. තව තත්පර කීපයකින් ඔලිම්පික් උලෙළ පිළිබඳ සජීවී දර්ශන කීපයක් ඔබට දක ගත හැකියි.

තරංග මෙසේ කීවේ ය: "ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උත්සවය අපේ ශ්‍රී ලංකාවේ සිට නැරඹීමට පුළුවන් වීම කෙතරම් වාසනාවක් ද?"



## පැහැදිලි කිරීම

**නාමාවලිය** – නම් වැල
**බුද් ද** – බද්ද
**භාරදූර කාර්යය** – බැරෑරුම් කටයුත්ත
**මහල් නිවාස සංකීර්ණය** – තට්ටු නිවාස සමූහය
**තේමා වාදනය** – කිසියම් වැඩ සටහනක් සඳහා විශේෂයෙන් පාවිච්චි කරන වාදනය

## අවබෝධය

1. මෙහි සඳහන් වන යහළුවන් එකිනෙකා හමුවීමට සෙනසුරාද දවස තෝරා ගත්තේ ඇයි?

2. නිසාම් සහ මහේන්ද්‍රන්, තරංගගේ ගෙදර යාමට හේතු දෙකක් තිබිණි. ඒ මොනවා ද?

3. රූපවාහිනිය නිපද වූ තැනැත්තාගේ නම කුමක් ද ? ඔහු ගැන වාක්‍ය දෙකක් කියන්න.

4. i. ආහාර වර්ගය කුමක් දැයි සුවඳින් හඳුනා ගත හැකි ද?

   ii. සුවඳින් හඳුනා ගත හැකි ආහාර වර්ගයක නම ලියන්න.

5. මේ පාඩමේ සඳහන් වන, අදහස් හුවමාරු කර ගන්නා ක්‍රම නම් කරන්න.

6. පාඩමෙහි දැක්වෙන අන්දරේ සහ රජතුමා පිළිබඳ නාට්‍ය කොටස කතන්දරයක් ලෙස කියන්න.

7. රජතුමා බලාපොරොත්තු වූ පරිදි සී සෑමේ මංගල්‍යය පැවැත්වීමට නොහැකි වූයේ ඇයි?

## භාෂා ක්‍රියාකාරකම්

8. එක්එක් වචනයට සමාන තේරුම ඇති වචනයක් බැගින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. ඉර .................. | | ii. යහළුවා .................. | |
| iii. කාලය .................. | | iv. පුතා .................. | |
| v. විස්මය.................. | | vi. මනාපය .................. | |

9. හිස් තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

i. රඟ පාන තැනැත්තා – ........................
ii. රඟ පාන තැනැත්තිය – ........................
iii. පොත්පත් කියවන්නා – ........................
iv. සවන් දෙන්නා – ........................
v. නරඹන්නා – ........................

(රචකයා, ශ්‍රාවකයා, පාඨකයා, ප්‍රේක්ෂකයා, නිළිය, නළුවා)

10. පහත සඳහන් වාක්‍ය කියවා සුදුසු විරාම ලකුණු යොදන්න.

i. තේ පානය කර ධනපාල මහතා කාමරයට ගියේ ය

ii. නිසාම් තරංග සහ මහේන්ද්‍රන් පස් වන ශ්‍රේණියේ ඉගෙන ගනිති

iii. කමලා මහත්මිය ආප්ප පිඟාන මේසය මත තැබුවා ය

iv. සුනේත්‍රා දුව තාත්තට කතා කරන්න

v. විවිධ රටවල තොරතුරු රූපවාහිනියෙන් දැනගත හැකි ය.

11. පහත දක්වෙන වචන ලැයිස්තුවෙන් නාම පද පමණක් තෝරා ඒවා හිස් කොටුවෙහි ලියන්න.

| | | | |
|---|---|---|---|
| නැන්ද | නැරඹුවා ය | පිහාන | ගියේ ය |
| කීවෙමි | ආප්ප | සුනේත්‍රා | ගුවන්විදුලිය |
| මහේන්ද්‍රන් | තාත්තා | බැලුවේ ය | ගියහ |

| නාම පද |
|---|
| |

## පැවරුම්

1. i. සතියේ දවස්වල නම් අනුපිළිවෙළින් ලියන්න.

   ii. දේශීය ක්‍රමය අනුව දවසේ නම එක් එක් දවස ඉදිරියෙන් ලියන්න.

   iii. දවස්වල නම් ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

2. වගුවක් සාදන්න. එහි දැනට වෙළෙඳපොළෙහි දක්නට ලැබෙන සිංහල පුවත් පත් සහ සඟරා කීපයක නම් ලියන්න.

| දිනපතා පුවත් පත් | සති අන්ත පුවත් පත් | ළමා පුවත් පත් | මාසික සඟරා |
|---|---|---|---|
| | | | |

3. ඔබ ප්‍රිය කරන ගුවන් විදුලි වැඩ සටහනක් ගැන වාක්‍ය තුනක් ලියන්න.